Alcohol and Drug
Information Centre

ADIC

No.40/18, Park Road, Colombo 05, Sri Lanka.
Tel: +94 11 2584416,+94 11 2592515, Fax: +94 112508484
Email: info@adicsrilanka.org
Web site: http//www.adicsrilanka.org

**මාධ්‍ය නිවේදනය 01 - 2021/12/15**

# දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම් දර්ශකය

දුම්කොළ කර්මාන්තය සහ එහි නිෂ්පාදන දැනටමත් වසරකට ගෝලීය වශයෙන් මිලියන අටකට අධික ජනතාවක් මරා දමයි, බොහෝ දුරට අඩු සහ මධ්‍යම ආදායම් ලබන රටවල. දුම්බීම බොහෝ ශ්වසන ආසාදන සහ බෝ නොවන රෝග සඳහා දැඩි අවදානම් සාධකයක් වන බැවින්, මෙම තත්වයන් ඇති පුද්ගලයින්ට COVID-19 වෛරසය ආසාධනයවීමේ සහ මරණයට ලක්වීමේ වැඩි අවදානමක් ඇත.

ආසියානු රටවල් සියල්ලම පාහේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) දුම්කොළ පාලනය පිළිබඳ සම්මුතියේ (FCTC) පාර්ශවකරුවන් වේ. FCTC 5.3 වගන්තිය අනුව පවතින දුම්කොළ පාලන පියවරයන් සහ නව ප්‍රතිපත්තීන් මගින් මහජන ජීවිතාරක්ෂාව සම්බන්ධ ප්‍රතිපත්තිවලට අභියෝග කරන, දුම්කොළ කර්මාන්තයේ උපාය මාර්ගවලින් ආරක්ෂා කිරීම සහ මහජන සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරයි. කෙසේ වෙතත්, 5.3 වගන්තිය ක්‍රියාත්මක කිරීමේ මාර්ගෝපදේශ බොහෝ රජයන් විසින් බොහෝ දුරට ප්‍රයෝජනයට නොගෙන පවතින අතර, සෞඛ්‍ය නොවන ප්‍රතිපත්ති සම්පාදනය විශේෂයෙන් දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම්වලට ගොදුරු විය හැකිය.

5.3 වගන්තිය සහ එහි මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීමේ යම් හිඩැසක් දුම්කොළ කර්මාන්තයට එහි ව්‍යාපාර සඳහා රජයන්ට බලපෑම් කිරීමට ඕනෑ තරම් අවස්ථාවන් සපයන බව COVID-19 වසංගතය ඉස්මතු කර ඇත. අඩු සම්පත් සහිත රටවල් දුම්කොළ කර්මාන්තයට විශේෂයෙන් ගොදුරු වේ. නිදසුනක් වශයෙන්, කර්මාන්තය සිය ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් වේගවත් කළේය. වෛද්‍ය උපකරණ පරිත්‍යාග සහ රෝහල් සැපයුම් වැනි, බදු සහන වැනි වරප්‍රසාද භුක්ති විඳිමින් සහ බදු වැඩි කිරීම් වැනි නියාමන ක්‍රියාමාර්ග අවහිර කරමින් රජයට ශක්තිමත් පැවැත්මක් සඳහා විභව සම්පත් ලබා දෙනු ඇත.

මෙම 3 වැනි ආසියානු දුම්කොළ කර්මාන්ත මැදිහත්වීම් දර්ශක වාර්තාව රටවල් 19 ක 5.3 වගන්තිය සහ එහි මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමේ මට්ටම මැන බලයි. බංග්ලාදේශය, බෲනායි, කාම්බෝජය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ජපානය, කොරියාව, ලාඕ පීඩීආර්, මැලේසියාව, මාලදිවයින, මියන්මාරය, නේපාලය, පකිස්ථානය, පිලිපීනය, ශ්‍රී ලංකාව, තායිලන්තය සහ වියට්නාමය යන රටවලට අමතරව මොංගෝලියාව රටවල් ලැයිස්තුවට එක්වේ. සෑම රටකම හවුල්කරුවන් මූලික සමීක්ෂණය සිදු කර 2020 ජනවාරි සිට 2021 මාර්තු දක්වා ප්‍රසිද්ධියේ පවතින සාක්ෂි මත පදනම්ව ජාතික වාර්තාවක් සකස් කරනු ලබයි. අනුකූලතාව සඳහා, දුම්කොළ කර්මාන්තයේ මදිහත් වීම් වල වාර ගණන සහ බරපතලකම හඳුනා ගැනීමට සහ ප්‍රමාණ කිරීමට සම්මත ප්‍රශ්නාවලියක් සහ ලකුණු කිරීමේ ක්‍රමයක් භාවිතා කරයි. මෙම සිදුවීම් ආමන්ත්‍රණය කිරීමට රජයේ ක්‍රියාමාර්ග හෝ ඊට දක්වන ප්‍රතිචාර මත මෙම වාර්තාව සකස්වේ. ඒ සඳහා සිද්ධියේ ලබා ගත හැකි දත්ත පමණක් භාවිතා කරන බැවින්, විශ්ලේෂණය සීමිතය. එසේ වුවද, මෙම තක්සේරු කිරීම් රජයන්ට දුම්කොළ පාලයේ ඇති දුර්වලතා හඳුනා ගැනීමටත් ඒවා අවම කිරීමට ගත කළ හැකි නිශ්චිත ප්‍රතිපත්තිමය හා ඒවා දියුණු කල හැකි ආකාරය හඳුනා ගැනීමට උපකාරී වේ.

**FIGURE 1:** TOBACCO INDUSTRY INTERFERENCE IN ASIAN COUNTRIES

Figure 1 shows the overall level of tobacco industry interference in 19 countries in Asia in 2021. Lower scores mean better implementation of Article 5.3 and its guidelines.





**FIGURE 2:** INDUSTRY PARTICIPATION IN POLICY DEVELOPMENT





**FIGURE 3:** INDUSTRY CSR ACTIVITIES





**FIGURE 4:** BENEFITS TO THE TOBACCO INDUSTRY




**FIGURE 5:** FORMS OF UNNECESSARY INTERACTIONS




**FIGURE 6:** TRANSPARENCY




**FIGURE 7**: CONFLICTS OF INTEREST




**FIGURE 8**: PREVENTIVE MEASURES





**නිගමනය සහ නිර්දේශ:**

2020 ලකුණු හා සසඳන විට, රටවල් පහක් (5) සුළු වශයෙන් වැඩිදියුණු වී ඇති අතර, හතරක් (4) නොවෙනස්ව පැවති අතර, රටවල් නවයක් (9) ඔවුන්ගේ 2021 ශ්‍රේණිගත කිරීම්වල පිරිහීම පෙන්නුම් කර ඇත. මෙම ප්‍රතිඵල කෙරෙහි සාධක දෙකක් බලපෑ හැකිය.

දුම්කොළ කර්මාන්තයේ වඩාත් ආක්‍රමණශීලී උපක්‍රම සහ කර්මාන්තයේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට මහජන දැනුවත්භාවය සහ සිවිල් සමාජයට ඇති හැකියාව වැඩි දියුණු වීම දැකිය හැකිය. දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් ඵලදායී ලෙස මැඩපැවැත්වීම සඳහා සමස්ත රාජ්‍ය ප්‍රවේශයක් මූලික වේ. විශේෂයෙන්ම COVID-19 වසංගතයේ සන්දර්භය තුළ සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන අමාත්‍යාංශ සහ අංශ දෙකම දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම්වලට බොහෝ දුරට ගොදුරු විය හැකිය. 5.3 වගන්තිය සාර්ථක ලෙස දුම්කොළ පාලනයට සහ වැඩිදියුණු කළ සෞඛ්‍ය ප්‍රතිඵල සඳහා අත්‍යවශ්‍ය වන බැවින් සියලුම රජයන් එය ක්‍රියාත්මක කිරීමට දරන උත්සාහය ශක්තිමත් කළ යුතුය.

**FIGURE 9**: PROGRESS IN COUNTERING TOBACCO INDUSTRY INTERFERENCE



දුම්කොළ කර්මාන්තයේ මැදිහත්වීම් මැඩලීමේ ප්‍රගතියක් ලබා ගැනීම සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ තත්ත්වය පෙර පැවති තත්ත්වයන්ට සාපේක්ෂව පිරිහී ඇති බව පැහැදිලිය. රට තුළ දුම්කොළ පාලනය දුර්වල වෙමින් පවතින අතර එය පාලනය කළ නොහැකි තත්වයට පත්වීමට ඉඩනොදී කඩිනමින් නිවැරදි කළ යුතු බව මෙයින් අවධාරණය කෙරේ.

මෙම පසුබෑමට ප්‍රධාන හේතුව වන්නේ දුම්කොළ කර්මාන්තය ක්‍රමානුකූලව ඔවුන්ගේ ක්‍රියාකාරී මැදිහත්වීම් වැඩි වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාත්ම වියහැකි පාලන යාන්ත්‍රණයන් දුර්වල වීමයි.

මෙම කනස්සල්ලට අවධානය යොමු කළ යුතු වුවද, පියවර ගත යුත්තේ රජය පමණක් නොවේ. පුද්ගලයන් සහ සංවිධාන මෙන්ම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ද ක්‍රියාකාරී ස්ථාවරයක් ගත යුතු අතර වත්මන් තත්ත්වය වැඩිදියුණු කළ හැකි ආකාරය පිළිබඳ සංවාදයක් ආරම්භ කිරීමට මූලිකත්වය ගත යුතුය.

ක්‍රියාත්මක කිරීමේ මිනුමක් ලෙස මෙම විශේෂිත මෙවලම ප්‍රතිපත්ති වෙනස් කිරීම හරහා සංවර්ධනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ ඉතා හොඳ ක්‍රමයකි.

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
නො. 40/18,
උද්‍යාන පාර,
කොළඹ 05.